**ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමය - 2019**
**---------------------------------------**

## 1.1 මතය වියාචනය
**-----------------**

ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමයේ 2019 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශය, සමුච්චිත අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සංගමයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.2 මතය වියාචනය සඳහා පදනම
**--------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
**-----------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංගමය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංගමය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංගමයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංගමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංගමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සංගමයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රීඩාංගන වෙන්කිරීම වෙනුවෙන් ලැබූ සෘජු ආදායම් රු.127,100 ක් සංගමයේ හිටපු පරිපාලක විධායක නිලධාරී විසින් බැංකුගත නොකිරීම හේතුවෙන් එම නිලධාරියාගෙන් ලැබිය යුතු අගයක් ලෙස සාවද්‍ය ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, අයකර ගැනීම අවිනිශ්චිත තත්වයක පැවති මෙම මුදල සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනය කිරීමට හෝ හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම කරුණ සම්බන්ධයෙන් බැඩ්මින්ටන් සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීමේදී තීරණයක් ගැනීමට බලාපොරොත්තු වෙමි. | අයකර ගැනීම අවිනිශ්චිත තත්වයේ පවතින මෙම වටිනාකම සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සැලසීමට හෝ හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුවීම. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ සංගමයේ ආරක්ෂිත කැමරා පද්ධතිය සහිත කැමරා 08 ක් මිලදී ගැනීම සඳහා වැය කර තිබුණු රු.73,800 ක් අළුත්වැඩියා වියදම් ලෙස දක්වා තිබීම හේතුවෙන් ජංගම නොවන වත්කම් හා ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට සටහන් කර ගතිමි | ආරක්ෂිත කැමරා මිලදි ගැනීම සඳහා වැයකර තිබුණු මුදල ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කළ යුතුවීම. |

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| | රු. | | | |
| දේපල පිරියත හා උපකරණ | 3,372,170 | භෞතික සත්‍යාපන වාර්තා සහ යාවත්කාලීන කළ ස්ථාවර වත්කම් ලේඛනය | 2020 අවසානයේදී ස්ථාවර වත්කම් සඳහා භෞතික සත්‍යාපනයක් සිදුකිරීමට බලාපොරොත්තු වෙමි | දේපල ,පිරියත හා උපකරණ වලට අදාළව ප්‍රමාණවත් හා යෝග්‍ය විගණන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 9,473,197 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.123,470 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.9,349,727 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙහෙයුම් වියදම් රු.10,416,168 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 3.1 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සංයුක්ත සැලැස්මක් පිළියෙල කිරීම සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂයේදී රු. 500,000 ක් සංගමයට ලබා දී තිබුණද සංගමය විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | මෙම කරුණ ශ්‍රී ලංකා බැඩ්මින්ටන්හි පෙර පැවති පරිපාලනයට අදාළ වේ. | සංගමයේ අනාගත දිශානතිය දැක්වෙන පරිදි සංයුක්ත සැලැස්මක් පිළියෙල කළ යුතුවීම. |

**3.2** **වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග 7 (XII) අනුව එලඹෙන වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර, වර්ෂය ආරම්භ වීමට මාස තුනකට පෙර අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කලයුතු වුවත් 2019 වර්ෂය සඳහා ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා බැඩ්මින්ටන්හි නව පරිපාලනය තේරී පත්වුයේ 2019 වර්ෂයේ ජූලි මාසයේදී බැවින් මෙම නිරීක්ෂණය පෙර පැවති පරිපාලනයට අදාළ වේ. | ජාතික ක්‍රීඩා සංගම් නියෝගවල දැක්වෙන පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුවීම. |

**3.3** **අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ සංගමයේ රු. මිලියන 51 ක ආදායමක් හා රු. මිලියන 61 ක වියදමක් පැවති අතර 2019 දෙසැම්බර් 31 දිනට මුළු වත්කම්වල එකතුව රු. මිලියන 4 ක් විය. එසේ වුවත් සංගමයේ කටයුතු සම්බන්ධව අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කිරීම පිළිබඳව සංගමයේ පාලක මණ්ඩලය අවධානය යොමුකර නොතිබුණි | අප සංගමයේ බාහිර විගණකයන් ලෙස පුද්ගලික විගණන සමාගමක් කටයුතු කරන අතර අභ්‍යන්තර විගණනයට වැඩියම් දෙයක් බාහිර විගණන ආයතනයෙන් ඉටුවන බව අපගේ විශ්වාසයයි. | සංගමයේ ගණුදෙනු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුවීම. |

**3.4** **අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එලදායි මුල්‍ය පාලනයක් සඳහා එක් එක් මුල්‍ය වර්ෂය ආරම්භ වීමට ප්‍රථම අයවැය ලේඛනයක් පිළියෙල කළ යුතු වුවද සංගමය විසින් සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | ශ්‍රී ලංකා බැඩ්මින්ටන්හි නව පරිපාලනය තේරී පත්වුයේ 2019 ජූලි මාසයේදී බැවින් මෙම නිරීක්ෂණය පෙර පැවති පරිපාලනයට අදාළ වේ | අයවැය ලේඛනයක් නිවැරදිව පිළියෙල කර එලදායි පාලන කාරකයක් ලෙස යොදා ගත යුතුවීම. |